**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

# ගාලු උරුමය පදනම

# පුරප්පාඩු දැන්වීම

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ පාලනය වන ගාලු උරුමය පදනමේ පුරප්පාඩු වී ඇති පහත දක්වා ඇති තනතුරු සඳහා සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ

## 01. අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී (MM1-1)

**තනතුරු සංඛ්‍යාව 01**

1 **සුදුසුකම් - බාහිර අයදුම්කරුවන් සඳහා**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සහිතව උපාධියක් ලබා ගැනීමෙන් පසු අවුරුදු 05 ක විධායක මට්ටමේ තනතුරක සේවය කිරීම.

2 **සුදුසුකම් - අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

01. (අ) ගාලු උරුමය පදනමෙහි කනිෂ්ඨ කළමනාකරණ (JM)සේවා ගණයේ I ශ්‍රේණියේ වසර (05) පහක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(ආ) විවිධ කණ්ඩායම් සමග සෘජුවම පාලනය කිරීම ප්‍රත්‍යක්ෂ වූ හැකියාවක් තිබීම හා කාර්යක්ෂම කළමනාකරණයක් හා මානව සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගත හැකි පළපුරුද්දක් තිබිය යුතුය.

**02. අනිවාර්ය සුදුසුකම්**

සුදුසුකම් ලැබීම සඳහා වන සේවා කාලය තුළ සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙනයුතු අතර, එම කාලය තුළ විනයානුකූල දඬුවම් ලබා නොතිබිය යුතුය.

**01.03 වැටුප් පරිමාණය** : රු.91,690 - 2,480 X 10 - 3,450 X15 - 168,240

(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 MM1-1 අනුව)

(උක්ත චක්‍රලේඛය අනුව 2025 වර්ෂයට හිමි වන මූලික වැටුප මසකට රු. 71,730/- ක් වේ. භාණ්ඩාගාරය විසින් අනුමත ජීවන වියදම් දීමනාව ලෙස රු. 17,800/-ක් හිමි වේ).

**01.04 වයස**

අවු. 22 ට නොඅඩු හා අවු.45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 02. පරිපාලන නිලධාරී (JM 1-1)

**තනතුරු සංඛ්‍යාව 01**

**02.01 සුදුසුකම් - බාහිර අයදුම්කරුවන් සඳහා**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම හා උපාධිය ලබා ගැනීමෙන් පසු රජය පිළිගත් ආයතනයක මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයෙහි වසර 03 ක අවම පළපුරුද්දක් තිබීම.

**02.02 සුදුසුකම් - අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

01. ආ.පො.ස.(උ.පෙළ) විභාගයෙන් විෂයන් තුනක් (03) සමත් කළමනාකරණ සහකාර (තාක්ෂණික/තාක්ෂණික නොවන) සේවා ගණයන්හි I වන ශ්‍රේණියේ වසර 05කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබීම.

**හෝ**

02. ව්‍යාපෘති සහකාර, ව්‍යාපෘති සහකාර (ගිණුම්) සේවා ගණයන්හි තනතුරක අවම වශයෙන් වසර පහ(05) කට නොඅඩු පළපුරුද්ද හා වසර පහක සතුටුදායක සේවා කාලයක් තිබීම.

**02.03 වැටුප් පරිමාණය** : රු.72,650 - 1,360 X 10 - 2,040 X18 -122,970

(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 JM1-1 අනුව) (උක්ත චක්‍රලේඛය අනුව 2025 වර්ෂයට හිමි වන මූලික වැටුප මසකට රු. 58,615/- ක් වේ. භාණ්ඩාගාරය විසින් අනුමත ජීවන වියදම් දීමනාව ලෙස රු. 17,800/-ක් හිමි වේ).

**02.04 වයස**

අවු.22 ට නොඅඩු හා අවු.45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 03. ගිණුම් නිලධාරී (JM 1-1)

**තනතුරු සංඛ්‍යාව 01**

**03.01 සුදුසුකම් -බාහිර අයදුම්කරුවන් සඳහා**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක (වාණිජවේදී/ කළමනාකරණ/ගිණුම්කරණ) උපාධියක් ලබා තිබීම හෝ සිව් අවුරුදු උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව ලබා තිබීම.

**සහ**

02. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අන්තර්මාධ්‍ය සමත්වීම (ICASL) හෝ වරලත් කළමනාකරණ ගිණුම්කරණ ආයතනයේ අන්තර් මධ්‍යය සමත්වීම (CIMA) හෝ ගිණුම්කරණ සහතික කරන්නන්ගේ සංගමයේ අන්තර් මධ්‍යය (ACCA) සමත්වීම.

**03.03. සුදුසුකම් - අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

ව්‍යාපෘති සහකාර, ව්‍යාපෘති සහකාර (ගිණුම්) සේවා ගණයන්හි තනතුරක අවම වශයෙන් වසර පහ (05) කට නොඅඩු පළපුරුද්ද හා වසර පහක සතුටුදායක සේවා කාලයක් තිබීම

**03.02 වැටුප් පරිමාණය** : රු.72,650 -1,360 X 10 -2,040 X18-122,970

(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 JM1-1 අනුව)
(උක්ත චක්‍රලේඛය අනුව 2025 වර්ෂයට හිමි වන මූලික වැටුප මසකට රු. 58,615/- ක් වේ. භාණ්ඩාගාරය විසින් අනුමත ජීවන වියදම් දීමනාව ලෙස රු. 17,800/-ක් හිමි වේ).

**03.03 වයස**

අවු. 22 ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 04. ආරක්ෂක නියාමක (PL1)

**තනතුරු සංඛ්‍යාව 03**

**04.01 සුදුසුකම්**

අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය.

රජයේ හෝ පුද්ගලික ආයතනයක ආරක්ෂක සේවයේ වසර 2 කට වැඩි කාලයක් සේවය කර තිබීම.

**04.02 වැටුප් පරිමාණය** : රු.40,500 - 450 X 10 - 490 X 7 - 540 X 7 - 590 X15 - 62,530

(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 PL 1 අනුව)
(උක්ත චක්‍රලේඛය අනුව 2025 වර්ෂයට හිමි වන මූලික වැටුප මසකට රු. 36,375/- ක් වේ. භාණ්ඩාගාරය විසින් අනුමත ජීවන වියදම් දීමනාව ලෙස රු. 17,800/-ක් හිමි වේ).

**04.04 වයස**

අවු.18 ට නොඅඩු හා අවු.45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**ඉහත තනතුරුවලට අදාළ වෙනත් තොරතුරු**

01. සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා හිමිකම් සහිත ස්ථිර තනතුරක් වේ.
02. පත්වීම් දින සිට වසර 03 ක පරිවාස කාලයකට යටත්ව තනතුරට පත්කරනු ලැබේ.
03. බඳවාගැනීමේ ක්‍රමය : ගාලු උරුමය පදනමේ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය පරිදි පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සෙකු තෝරාගනු ලැබේ.
04. අයදුම්කරුවන් පිළිබඳ විමසා බැලීම සඳහා ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා දුරකථන අංකය අයදුම්පත්‍රයේ සඳහන් කර තිබිය යුතුය.
05. අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ පළාත් රාජ්‍ය සභා සේවය/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ ව්‍යවස්ථාපිත ආයතනවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත ආයතනයේ ප්‍රධානියා මගින් එවිය යුතුය.
06. අයදුම්පත www.galleheritage.gov.lk ගාලු උරුමය පදනමේ නිල වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**සෑම ඉල්ලුම්කරුවෙක්ම,**

- ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික, මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

ඉහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම සුදුසුකම් තහවුරු කෙරෙන සහතිකවල පිටපත් සමඟ අදාළ ගණය සඳහා අයදුම්පත් 2025.12.21 දිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු අතර, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ තමා ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය. අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති,**
**ගාලු උරුමය පදනම, අංක 12,**
**රැම්පාට් වීදිය, කොටුව, ගාල්ල.**
**දු. ක - 0912246784**